සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)   25873

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

කාලය / நேரம் / Time } පැය 3 යි

නම / பெயர் / Name } ........................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ........................

## I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

අමතර කියවීම් කාලය වි.10

1. සිදුහත් කුමරු ගිහිගෙය හැරගියේ වයස,
   I. අවුරුදු 31 දිය.  II. අවුරුදු 26 දිය.  III. අවුරුදු 29 දිය  IV. අවුරුදු 35 දිය.
2. සසර දුකට මුල්වන පංචස්කන්ධය නමැති ගෙය තනන වඩුවා ලෙස බුදුරජාණන් වහන්සේ හඳුනාගත්තේ,
   I. ඊර්ෂ්‍යාවයි.  II. ව්‍යාපාදයයි.  III. ජාතියයි  IV. තණ්හාවයි.
3. සිව් සඟරාවත ට අයත් නොවන්නේ,
   I. දානය යි.  II. සීලය යි  III. සමානාත්මතාවයයි  IV. ප්‍රියවචනය යි.
4. සත්‍යය අවබෝධ කර ගන්නා ආකාර තුනක් ත්‍රිවිධ බෝධිය ලෙස බුදු දහමේ දැක්වේ. එම තුන් ආකාරය නම් කරන්න,
   I. බුදු, පසේ බුදු, මහරහත්  III. බුද්ධරත්නය ,ධම්මරත්නය, සංඝරත්නය
   II. සීල, සමාධි, ප්‍රඥා  IV. අනිත්‍ය,දුක්ඛ,අනාත්ම
5. මැවුම්කාර, සර්ව බලධාරී දෙවියෙකු ,බ්‍රාහ්මයකු, ඊශ්වරයෙකු ඇත යන ලෝකයේ බොහෝ ආගමික චින්තාවන්හි පදනම වූ සිද්ධාන්තය බැහැර කෙරෙන බුදු දහමේ මූලික ඉගැන්වීම,
   I. පුබ්බේකත හේතුවාදයයි.  III. හේතුඵලවාදයයි.
   II. ඊශ්වර නිර්මාණවාදයයි.  IV. අවිහිංසාවාදයයි.
6. ධම්ම පදයේ අන්තර්ගත වග්ග ගණන හා ගාථා ගණන පිළිවෙලින්,
   I. 25 හා 299  II. 26 හා 423  III. 26 හා 288  IV. 30 හා 436 .
7. නිදොරින් සිදු කරන අකුසල කර්මයන්හි කාය කර්ම වලට අයත් නොවන්නේ,
   I. අභිධ්‍යාව  II. කාමමිථ්‍යාචාරය  III. ප්‍රාණඝාතය  IV. අදත්තාදානය
8. විනය පිටකයට අයත් ග්‍රන්ථ පහෙන් එකකි,
   I. ජාතකට්ඨකථා  II. පරිවාර පාළි  III. ධම්ම පදය  IV. මහා පච්චරි අටුවා
9. එලු සඳස් ලකුණ හා කාව්‍යශේඛර යන ග්‍රන්ථ රචනා කළ සාහිත්‍ය යුග පිළිවෙළින් සඳහන් වන්නේ,
   I. දඹදෙණිය හා කෝට්ටේ සාහිත්‍ය යුගය  III. මහනුවර හා ගම්පොළ සාහිත්‍ය යුගය
   II. ගම්පොල හා කෝට්ටේ සාහිත්‍ය යුගය  IV. දඹදෙණිය හා කුරුණෑගල සාහිත්‍ය යුගය
10. ධර්ම කොටස් මුඛ පරම්පරාගතව රැක ගෙන යාමේදී අංගුත්තර නිකාය පවරනු ලැබුවේ,
    I. ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට.  III. අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට.
    II. සියලුම භික්ෂූන් වහන්සේලාට.  IV. මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට.
11. බෝසතාණන් වහන්සේ උපේක්ෂා පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය හෙළි වන්නේ,
    I. තේමිය ජාතක කතාවෙනි  III. මඝ මානවක ජාතක කතාවෙනි
    II. ලෝම හංස කතාවෙනි  IV. සීලවීමංස ජාතක කතාවෙනි



CamScanner

12. පංචානන්තරිය පාප කර්ම, පංච අභිඥා, අෂ්ට සමාපත්ති යන කර්ම අයත් වන්නේ,

I. ගරුක කර්මවලට ය.
II. ආසන්න කර්ම වලට ය.
III. ආචින්න කර්ම වලට ය.
IV. කටත්තා කර්ම වලට ය.

13. තෙරුවන් පිළිබඳ කරුණු නොදැන පදනමකින් තොරව සිතෙහි ඇතිවන පැහැදීම,

I. ආකාරවතී ශ්‍රද්ධාවයි.
II. අවෙච්චප්පසාදයයි
III. ආගමික භක්තිය යි.
IV. අමූලික ශ්‍රද්ධාවයි.

14. ' ජිගච්ඡා පරමා රෝගා' යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කරනු ලැබුවේ,

I. රෝගාබාධ අඩු බවයි.
II. ප්‍රමාණයට ආහාර අනුභව කළ යුතු බවයි.
III. නිරෝගී කම උතුම්ම ලාභය බවයි
IV. කුසගින්න ලොව බලවත්ම රෝගය බවයි.

15. තෙවන ධර්ම සංගායනාවෙන් පසු බුදුදහම දේශ දේශාන්තර වල ව්‍යාප්ත කිරීමේදී හිමවන්ත ප්‍රදේශය ට ධර්ම ප්‍රචාරය කළ කණ්ඩායමේ නායකත්වය දැරුවේ,

I. මිහිඳු මහරහතන් වහන්සේ.
II. මහාදේව තෙරුන් වහන්සේ.
III. රක්ඛිත තෙරුන් වහන්සේ.
IV. මජ්ඣිම තෙරුන් වහන්සේ.

16. බුදුන් වහන්සේ මාර පරාජයේදී මහපොළොව සාක්ෂි දරන බව සංකේතවත් කරන මුද්‍රාව වන්නේ,

I. අභය මුද්‍රාව
II. ධ්‍යාන මුද්‍රාව
III. භූමි ස්පර්ශ මුද්‍රාව
IV. විතර්ක මුද්‍රාව

17. නිබද්ධ චාරිකා යනුවෙන් හැඳින්වෙන්නේ බුදුරදුන්,

I. දිනපතා ගම් නියම් ගම්හි සිදුකරන පිණ්ඩපාත චාරිකාවයි.
II. විශේෂ පුද්ගලයෙක් හෝ පිරිසක් වෙනුවෙන් වැඩම කිරීමයි.
III. දරුණු පුද්ගලයින් සුමඟට ගැනීමට වැඩම කිරීමයි.
IV. දේශ දේශාන්තරයන්හි ධර්මය ප්‍රචාරණය කිරීමට වැඩම කිරීමයි.

18. උපතිස්ස පිරිවැජියා ට බුදුරදුන් දේශනා කරනු ලබන දහම පටිච්ච සමුප්පාදය බව පෙන්වා දෙනු ලැබුවේ,

I. අස්සජි මා හිමියන්ය.
II. සැරියුත් හිමියන් ය.
III. ආනන්ද හිමියන්ය.
IV. සුභද්‍ර හිමියන්ය.

19. නිවන් මග ආවරණය කරනු ලබන පංච නිවරණ ධර්ම අතර 'උද්ධච්ච කුක්කුච්ච' උපමා කර ඇත්තේ,

I. පාසි සහිත ජලයට ය
II. රත්වී උතුරන ජලයට ය .
III. කැළඹී ගිය ජලයට ය.
IV. බොර වී ගිය ජලයට ය.

20. පරලොවක් නැති බැවින් මෙලොව දී සියලු සැප විඳීමට කැමැත්ත,

I. උපධි තණ්හාවයි
II. විභව තණ්හාවයි
III. භව තණ්හාවයි
IV. කාම තණ්හාවයි

21. අනුලෝම පටිච්ච සමුප්පාදය අනුව සසර දුක ඇති වීමේ දී සළායතනය හේතුකොටගෙන,

I. තණ්හාව ඇතිවේ.
II. සසර ඉපදීම සිදුවේ.
III. ප්‍රතිසන්ධි සිත පහළවේ.
IV. ස්පර්ශය ඇතිවේ

22. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයන් විසින් රචිත ධර්ම ග්‍රන්ථයක් වන්නේ,

I. සරාර්ථ සංග්‍රහය
II. හිතෝපදේශය
III. ධර්ම විනිශ්චය
IV. පාරමිතා ප්‍රකරණය

23. ' ගෙරි මස් නොකව්' යන පාඨය රථයේ සඳහන් කොට තිබුණේ,

I. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාය
II. දුටුගැමුණු මහරජතුමාය
III. ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාය
IV. ශ්‍රීමත් වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමාය

24. වජ්ජි රජ දරුවන් තම පාලනයේ අභිවෘද්ධිය පිණිස සමූහාණ්ඩු පාලන ක්‍රමයක් ගෙන යන ලදී. එහි දී ඔවුන් අනුගමන කළ ප්‍රතිපත්තියක් වන්නේ,

I. සතර සංග්‍රහ වස්තු.
II. දස සක්විතිවත්.
III. දසරාජධර්ම.
IV. සප්ත අපරිහානීය ධර්ම.

25. පියගැටපෙළ නගින්නන්ගේ ආරක්ෂාව හා පියගැට පෙළෙහි ආරක්ෂාව සඳහා ආධාරකයක් වශයෙන් ගොඩනහා නිර්මාණය,

I.කොරවක් ගලයි.
II.බෝධිඝරයි
III.මුරගලයි
IV. වාහල්කඩයි

26. බුදු දහම තුල රෝග පීඩාවන්ට ලක්වීම හඳුන්වන්නේ,

I.ජරාව නමිනි.
II. ජාතිය නමිනි.
III. ව්‍යාධි නමිනි.
IV. පරිදේව නමිනි.



CamScanner

27. ස්වයංපෝෂිත ප්‍රඥාව හා උත්සාහය තුළින් තමන්ට මුහුණදීමට සිදුවන අකුසල කර්ම මගහරවා ගත හැකි වන්නේ,
I. උපධි සම්පත්තියෙනි. II. ප්‍රයෝග සම්පත්තියෙනි III. කාල සම්පත්තියෙනි. IV. ගති සම්පත්තියෙනි.

28. බුද්ධාදීන් තෝරාගෙන සුළු සුළු කාරණයට පෙන්වා දුන් පුද්ගලයින් තුළ දක්නට ලැබෙන විෂමතා අතර අවලස්සන යන හඳුන්වන්නේ,
I. නීච කුලීනා නාමිනී.
II. දුබ්බණ්ණා නාමිනී.
III. අප්පායුකා නාමිනී.
IV. වණ්ණවන්තා නාමිනී.

29. විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නමක් නොවන්නේ,
I. ත්‍රිලක්ෂණ භාවනාව
II. විපස්සනා භාවනාව
III. ප්‍රඥා භාවනාව
IV. චිත්ත භාවනාව

30. සමථ භාවනාව සඳහා යොමු වීමේ දී පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
I. සති සම්පජඤ්ඤ II. ඉන්ද්‍රිය සංවරය III. කල්‍යාණ මිත්තතා IV. සන්තුට්ඨිතා

31. අටලෝ දහමට කම්පා නොවී සියල්ල මධ්‍යස්ථ සිතින් දරා ගැනීම බුදු දහම තුළ හඳුන්වන්නේ,
I. තාදී ගුණය ලෙසය.
II. යථාවාදී තථාකාරී ගුණය ලෙස ය.
III. පුරිසදම්මසාරථී ගුණය ලෙසය.
IV. විජ්ජාචරණ සම්පන්න ගුණය ලෙස ය.

32. ධනය නිසි ලෙස පරිභෝජනය කිරීමේදී පංචබලි නම් වූ යුතුකම් පහක් ඉටු කළ යුතු බව සඳහන් සූත්‍ර දේශනාව වන්නේ,
I. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය II. සිඟාලෝවාද සූත්‍රය III. පත්තකම්ම සූත්‍රය IV. කාලාම සූත්‍රය

33. බුදුදහමෙහි 'උදුම්බරඛාදික' යනුවෙන් පෙන්වා දෙන පුද්ගලයාගේ ලක්ෂණය වන්නේ,
I. ආය- වැය සමව පවත්වා ගැනීමයි
II. ආදායමට වඩා වියදම් කිරීමයි
III. ඉහළ ආදායමක් ලැබීමයි
IV. වියදම් නොකර නොකා නොබී සිටීම යි

34. පරාභව සූත්‍රයට අනුව පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු දේශනා කළ ගාථා ගණන,
I. 38කි. II. 18කි. III. 24කි. IV. 12කි.

35. ඝණ්ටාකාර දාගැබක ගර්භයේ ස්වරූපය අනුව එය,
I. කලයක හැඩයක් ගනී.
II. නෙල්ලි ගෙඩියක හැඩයක් ගනියි.
III. ඝන්ටාරයක හැඩයක් ගනී.
IV. සීනුවක හැඩයක් ගනී.

36. සතර මාර්ග, සතර ඵල, උතුම් නිවන යන ලෝකෝත්තර ධර්මය තමන් විසින් ප්‍රත්‍යක්ෂ කොට දැකිය හැකි බැවින් ධර්මය,
I. අකාලික වේ. II. සන්දිට්ඨික වේ III. ඒහිපස්සික වේ IV. ඕපනයික වේ

37. සාහස්සික සංගීතියට මූලිකත්වය ගෙන කටයුතු කරනු ලැබුවේ,
I. මහා කාශ්‍යප තෙරුන්ය.
II. සබ්බකාමී මහ තෙරුන්ය
III. මොග්ගලිපුත්තතිස්ස මහ තෙරුන්ය.
IV. ආනන්ද මහ තෙරුන්ය.

38. මිය පරලොව ගොස් ඊළඟ භවයක උපත ලබා දීමට ඉවහල් වන කර්මය,
I. උපපීඩක කර්මය යි.
II. උපත්ථම්භක කර්මය යි.
III. උපඝාතක කර්මය යි.
IV. ජනක කර්මයයි.

39. පොතපත කියවීමෙන් හා ගුරු බසට සවන් දීමෙන් දියුණු කරගත හැකි නුවණ බුදුදහමේ හැඳින්වෙන්නේ,
I. සුතමය ප්‍රඥා නාමිනි.
II. භාවනාමය ප්‍රඥා නාමිනි
III. චින්තාමය ප්‍රඥා නාමිනි
IV. වාගමය ප්‍රඥා නාමිනි

40. පච්චේක බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා පුරනු ලබන්නේ,
I. පාරමී පමණි.
II. පරමත්ථ පාරමී පමණි
III. පාරමී, උපපාරමී පමණි
IV. උපපාරමිතා හා පරමත්ථ පාරමී පමණි

CamScanner

# II පත්‍රය

සැලකිය යුතුයි.

- පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු විස්සක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

1. i. සිදුහත් කුමරුට වාසය කිරීම සඳහා පියරජතුමා සාදා දුන් මාලිගා මොනවාද?
   ii. 'විසේසේන පස්සතිති විපස්සනා' මෙහි අදහස ලියන්න.
   iii. අමාවතුර හා බුත්සරණ ග්‍රන්ථ රචනා කළ කතුවරු පිළිවෙළින් නම් කරන්න.
   iv. සතර සංග්‍රහ වස්තු නම් කරන්න
   v. ශ්‍රද්ධාවේ ප්‍රභේද මොනවාද?
   vi. බුදු පිළිමයක දක්නට ලැබෙන ආසන වර්ග 02ක් නම් කරන්න
   vii. චතුරාර්ය සත්‍යය නම් කරන්න
   viii. බුදු දහම තුළ පෙන්වා දෙන නොකළ යුතු වෙළඳාම් දෙකක් ලියන්න
   ix. "උපාදාන පච්චයා භවෝ" යන්නෙහි අදහස කුමක්ද?
   x. අණන සුඛය යන්න කෙටියෙන් හඳුන්වන්න.

2. i. දසපාරමිතා වලින් දෙකක් නම් කරන්න
   ii. පාරමිතා ධර්ම පුහුණු කරන්නෙක් ඒවා කරුණු පහකින් සම්පූර්ණ කළ යුතුය ඉන් අත්හළ යුතු කරුණු මොනවාද?
   iii. දැහැමි මිත්‍රශීලී සමාජයක් ගොඩනැගීම සඳහා පාරමිතා ධර්ම හේතුවන ආකාරය විස්තර කරන්න

3. i. අත්තනාව කතං පාපං යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න
   ii. එම ගාථාවේ තේරුම ලියන්න
   iii. පුද්ගලයාගේ දියුණුව සඳහා උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපද ග්‍රන්ථයේ වටිනාකම පැහැදිලි කරන්න

4. i. මධ්‍යම ප්‍රතිපදාවට පිවිසීමට පෙර බෝසතාණන් වහන්සේ අත්හළ අන්ත දෙක නම් කරන්න
   ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාව අයත් අංග නම් කරන්න
   iii. යහපත් සමාජ ජිවිතයකට ආර්ය අෂ්ටාංගික මාර්ගය උපයෝගී කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න

5. i. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?
   ii. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය දැරූ මහරහතන් වහන්සේ හා අනුග්‍රහය දැක්වූ පාලකයා නම් කරන්න.
   iii. ප්‍රථම සංගායනාවේ ප්‍රතිඵල තුළින් ථේරවාදී ධර්මය ඉදිරියට පවත්වාගෙන යාමට හැකි වූ අයුරු විස්තර කරන්න

6. i. බුදුන්වහන්සේ දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ මෙලොව දියුණුවට හේතුවන කරුණු මොනවාද?
   ii. බුද්දහමින් නිර්දේශිත ධාර්මික ජීවන වෘත්තීන් තුනක් නම් කරන්න.
   iii. බුදු දහමේ චිරස්ථිතිය සඳහා ධර්ම සංගායනා කොතරම් දුරට ඉවහල් වූවා ද යන්න විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
   i. දුටුගැමුණු රජතුමා.
   ii. දුමින්දාගමනය.
   iii. බෝධිසරය
   iv. දසරාජ ධර්ම.



CS CamScanner

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**